# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2023 (2024)

**මෙම විභාගයේදී සෑම විභාග අපේක්ෂකයකුම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (Online) ක්‍රමය මගිනි.**

උක්ත විභාගයට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2024 ජනවාරි මස 23 දින සිට 2024 පෙබරවාරි මස 15 වන දින තෙක් භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන්ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත මාර්ගගත ආකාරයෙන් (Online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය හා විෂයයන්** ඇතුළත් කිරීමේදී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. සංශෝධන සඳහා පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

### 02. අයදුම්පත්

2.1
- ■ මෙම වර්ෂයේ සිට සියලු ම පෞද්ගලික අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා අයදුම් කිරීමේ දී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ■ ජාතික හැඳුනුම්පත නොමැති වයස අවුරුදු 15 ට වඩා අඩු අයදුම්කරුවෙකු අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් විභාගය අයදුම් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණීම අනිවාර්ය වේ.

2.2 මාර්ගගත (Online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව PDF ගොනුවේ මුද්‍රිත පිටපත ලබා ගැනීම අනිවාර්යය වන අතර, අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබා ගත යුතුය. මුද්‍රණය කරගත් පිටපත දෙපාර්තමේන්තුවට එවීම අවශ්‍ය නොවේ.

පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගය ඉල්ලුම් කළ හැක්කේ රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලකින් ශිෂය කාර්ය දර්ශනය (අස්වීම් සහතිකය/ අධ්‍යාපන බී59) ලබා ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙනුම ලබමින් පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.

2.3 2024 පෙබරවාරි මස 15 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. **නියමිත දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසු මාර්ගගත ප්‍රවේශය වසා තබනු ලැබේ. කිසිදු හේතුවක් මත හෝ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය දීර්ඝ කිරීමක් සිදු නොකෙරේ.**

2.4 එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.

### 03. පද්ධතියට ප්‍රවේශ වීම හා අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණික උපදෙස්

3.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- ● නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස, "අපගේ සේවා", යටතේ ඇති, "Exam Information Center" මත Click කිරීම මගින් හෝ,
- ● https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

3.2 පළමුව ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ඇතුළත් කර ලියාපදිංචි විය යුතු ය.

3.3 ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් පසුව ඔබට ලැබෙන කෙටි පණිවිඩයෙහි (SMS) සඳහන් කේත අංකය (OTP) භාවිත කර පද්ධතියට ප්‍රවේශ විය යුතු ය.

3.4 එහි සඳහන් උපදෙස් හොඳින් කියවා අමතර උපදෙස් සඳහා "Instructions" ලෙස පෙන්වන බොත්තම (Button) තෝරන්න (Click) තාක්ෂණික උපදෙස්, පොදු උපදෙස් හා උපදෙස් වීඩියෝව නැරඹීමෙන් අනතුරුව "Next" බොත්තම (Button) තෝරා අයදුම්පත සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.

### 04. විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit payment) සිදු කළ හැකිය.

4.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම්, "Payment Method" යටතේ ඇති "Pay by Department of Posts" සබැඳිය තෝරා ගත යුතු ය. **එහිදී ඔබට ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.**

**ගෙවීම සාර්ථක වූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය (link) සක්‍රිය කිරීම මගින් අදාළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත (Download) කර ගැනීමට හැකි වේ.**

4.2 බැංකු කාඩ්පත් (Credit/Debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/debit card" අයිතමය තෝරා ගත යුතුය.

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 6-9 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 100/- | 150/- | 200/- | 250/- | 300/- | 350/- |

05. ඔබ තෝරා ගන්නා විෂයයන් හා නගරය ඉතා වැදගත් වේ. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්නතම නගරයේ ඇති විභාග මධ්‍යස්ථානයට යොමු කිරීම සිදුවේ.

06. **ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රය සම්බන්ධව කිසියම් විමසීමක් කරන්නේ නම්, ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහාම එම ප්‍රවේශ පත්‍රය ද රැගෙන විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත පැමිණිය යුතුය.**

07. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක් ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය ලිවිය යුතු අතර, අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය ඇතුළත් නොකළ යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ද ඇතුළත් කළ යුතු ය.**

08. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා හඳුනාගැනීමේ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම විභාගය සඳහා අයදුම් කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම්, "Are you a special needs candidate?" හි Yes යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

10. **විශේෂයෙන් සැලකිය යුතුයි**

10.1 මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

10.2 **විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය හෝ අයදුම් කරන ලද මාධ්‍යය හෝ අයදුම් කරන ලද විෂයයන් හෝ වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ දත්ත නිවැරදිව ඇතුළත් කළ යුතු ය.**

10.3 දෙවන විෂය කාණ්ඩයට අයත් පහත සඳහන් විෂයයන් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුවේ. මෙම අවශ්‍යතාවය සම්පූර්ණ නොකරන අයදුම්කරුවන්ට ලිඛිත විභාගයට පෙනී සිටිය ද ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.

(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භරත)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

උක්ත කරුණු සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් විමසීම් සිදු කළ හැකිය.

යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංක වලට අමතන්න.

**විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com**
**දුරකථන අංක : 011-2784208 / 011-2784537/ 011-2785922**
**මාර්ගගත ඒකකය**
**දුරකථන අංක : 011-3671568 / 011-3661122**

**යොමු අංකය : 6/4/OL/2023**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503, කොළඹ.**
**2024.01.23**

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
**විභාග කොමසාරිස් ජනරාල්**